# මුළු ලොව ම නැති වුණත්






මෙල්බර්න් නුවර පැවැත්වෙන සංගීත ප්‍රසංගයක් සඳහා මව්බිමේ ගීත ක්ෂේත්‍රයේ සිටිනා ප්‍රවීණ ශිල්පීන් කිහිප දෙනෙක්ම සම්බන්ධ වෙනවා. ඒ රෝහණ වීරසිංහ සංගීතවේදියාණන් සමග ටී. එම් ජයරත්න සහ එඩ්වඩ් ජයකොඩි යන ගායන ශිල්පීන්. රෝහණ වීරසිංහයන්ගේ සංගීතයට අනුව ටී.එම් ජයරත්නයන් ගැයූ ඉතා ජනප්‍රිය ගීතයක් අපගේ මතකයට ආවා. ඒ. "මුළු ලොවම නැතිවුණත්" ගීතය. මේ තරම් ප්‍රේමාන්විත ගීතයක් ලියවුණේ කොහොමද? ඒ අත්දැකීම ගැන දැන ගන්නට සුදුසුම පුද්ගලයා ගීත රචකයායි. ඉතින් " ගී සඳළුව" වෙනුවෙන් මේ ගීතය රචනා කළ කුලරත්න ආරියවංශ ප්‍රවීණ ගීත නිබන්ධකයාණන් දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට අප අදහස් කළා.

ආ ගිය තොරතුරු යනාදිය කතා කරමින් සුහද පිළිසඳරකින් පසුව ආරියවංශයන් ගීතය පිළිබඳව තමන්ගේ අත්දැකීම විස්තර කළේ මේ විදියටයි.

එක්දහස් නවසිය අසූවේදී විතර කැසට් පට් ජනප්‍රිය වෙල් ඒ වෙනුවෙන් ගීත බොහෝ නිර්මාණය වුණා. ඉතින් අපටත් ඉඩ ලැබුණා ගීත ලියන්නට. ඉතින් ඔය අපි හද්‍ර යෞවනයේ හිටිය කාලයක්. මගේ ගීත වැඩිහරියක් ලියවුණේ මල්ලි, අත්දැකීම් ඇසුරින්මයි. ආදරණීය බව එක් කරමින් බොහෝ ප්‍රේම ගීත ලියූ කුලරත්න ආරියවංශයන්ගේ හඬ අදටත්, කාටත් ආදරණීයයි.

"මෙයා මට මුණගැහිලා දැන අඳුනගත්තේ මම විශ්වවිද්‍යාලයට තේරිලා ඉන්න කාලේ" ආරියවංශයන් " මෙයා" නමින් හැඳින්වූයේ තමන්ගේ ප්‍රිය බිරිඳවයි.

"ඒ කාලයේ අපි ඉතින ඔය මහජන පුස්තකාලයට යනවා. විභාගය ඉවරවෙලා තිබුණත් මොනවා හරි කියවන්න තිබුණ පුරුද්ද, ආසාව හන්දයි එහෙම ගියේ. ඉතින් මෙයා එක්ක බොහොම සමීප ඇසුරක් ගොඩනැගුනා. පසුබිම තමයි කොළඹ මහජන පුස්තකාලය. එතැන්දියි මට මෙයාව මුණගැහුණේ.

"මෙයා ඇවිල්ලා මල්ලී,
පවුලේ එකම ළමයා. ඒ පවුල් පරිසරයෙ හැටියට මෙයාව ඉක්මණින් විවාහ කරලා දෙන්නයි ඕන කරලා තිබුණෙ. ඒත් මම?"

"මම පවුලේ වැඩිමලා. මට බාල සහෝදර සහෝදරියන් හත් දෙනයි. ඒ අය විවාහ වෙනකල් මට විවාහයකට අවසරයක් නෑ. විශ්වවිද්‍යාලෙත් යන්නනේ බලාගෙන හිටියෙ. ඉතින් අපි ආදරය කරන කාලෙ අපි හිටියේ පුදුම පීඩනයකින්. අපි ඉතින් මහජන පුස්තකාලයේදී මුණ ගැහිලා විහාර මහදේවී පාක් එක දිගේ ඇවිදින ගමන්, ඔය ගහක් යටට වෙලා ඉන්න ගමන්, කතා කළේම ඔය ගැන. අපට කවදාවත් විවාහ වෙන්න නම් වෙන්නෙ නෑ. ඒ හන්දා හැමදාම කතා කළේ අපේ වෙන් වීම ගැන. වෙන් වීමෙන් පස්සේ ජීවත් වෙන හැටි ගැන ......"

"මම හිතා ගත්තා මම විවාහ නොවී ඉන්නවා කියලා. මෙයාගෙ හිත තියෙන්නේ මගේ ළඟනේ. මෙයට වෙන කෙනෙක් එක්ක ගත කරන විවාහ ජීවිතේදී කරදර වුණොත් මං එදාට ඉදිරිපත් වෙනවාය කියලා හිතුවා. ඒ කාලෙ ඔය "ගොළු හදවත" චිත්‍රපටිය එහෙම ජනප්‍රිය වුණ කාලෙ. ඉතින් ඒ කතාවෙ වාගේ කවුරු නැති වුණත් මං ඉන්නවානේ කියලා හිතුවා...."

"හැබැයි ඉත්නි දෛවය ඒ ඔක්කොම වෙනස් කළා. විශ්ව විද්‍යාලෙ පළවෙනි වසරේ ඉන්නකොටම අපි ගෙවල්වල විරුද්ධකම් මැද්දෙ විවාහ වුණා. එතකොට මගේ වයස අවුරුදු විසි එකයි. "


මුළු ලොව ම නැතිවුණත්
- එක ම හදවතක්
ඇත ඔබේ නාමයෙන්...

ඔබේ සෙවණෙහි රැඳී ඉන්නට
වරම් නැති වූ ලෝකයෙන්
වෙන්ව සිටිනා හුදකලාවේ
එක ම එක හදවතක්
ඇත ඔබේ නාමයෙන්!

ලොවේ දිනයක නැති වුණොත්නම්
ඔබේ හද සෝ නාදයෙන්
සොයා එන්නට සිටින කැදවී
එක ම එක හදවතක්
ඇත ඔබේ නාමයෙන්...!

රචනය : කුලරත්න ආරියවංශ
සංගීතය : රෝහණ වීරසිංහ
ගායනය : ටී. එම්. ජයරත්න.

"මේ ගීතය ලිව්වේ විවාහ වුණාට පස්සෙයි. අවුරුදු විසි හතක් විතර වෙලා එතකොට. අර ඒ දවස්වල විඳපු දුක, හුදෙකලාව, ආදරය, සමුගැනීමේ වේදනාව වගේ දේවල් මේ පදවලට ඉබේම එකතු වුණා. මුළු හදවතින්ම තමන්ට දැණුන දේ ලියවුණ නිසා වෙන්න ඇති මේ ගීතය රසිකයින් අතරට මේ තරමට යන්න ඇත්තේ....."

කුලරත්න ආරියවංශයන් තමන්ගේ අත්දැකීම ඔය විදියට අප හමුවේ කියා සිටියා. අප හට කවදත් හුරු ආරියවංශයන්ගේ වචන වලින්ම පාඨකයින් හමුවේ එය ලියා තියන්නට අප උනන්දු වුණේ ඒ ලෙංගතුකම් ටිකක් හරි දැනේවි කියන අදහසින්.

පිළසඳර නිමාවේ අප කුලරත්න ආරියවංශයන්ට පාඨකයින් වෙනුවෙන් ස්තුතිවන්ත වූවා.


## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com



Advice on Legal Matters

GATEWAY LAWYERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises
**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193



GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia

Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au